**ශීර්ෂය 155 - පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 155 - පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 ජුනි 07 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් සහ සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 298,435.06 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 226,994.67 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරි වීම රු. මිලියන 71,440.39 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 23.94 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 233,151.23 | 168,558.30 | 64,592.93 | 27.70 |
| මූලධන | 65,283.83 | 58,436.37 | 6,847.46 | 10.49 |
| **එකතුව** | **298,435.06** | **226,994.67** | **71,440.39** | **23.94** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

අමාත්‍යාංශයට අදාළ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 15501 | 5.00 | 0.95 | 0.50 | 0.90 | 35.00 | 23.18 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය යටතේ වන තැන්පත් ගිණුම් 03 ක 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 67.64 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. මිලියන |
| 6000/0000/00/0002/0165/000 | 0.07 |
| 6000/0000/00/0016/0110/000 | 67.22 |
| 6000/0000/00/0018/0109/000 | 0.35 |
| එකතුව | 67.64 |

## 2.4 විගණන නිරීක්ෂණය

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණයන් ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
|---|---|---|
| (අ) | පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අයවැය විචලනය

වැය විෂයයන් 71 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

#### 3.2.2 ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 9 ක් සඳහා සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය එකතුව රු.359,367 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඉතිරිය රු.2,643,084 කින් ඉක්මවා රු.3,002,451 ක බැරකම්වලට එළඹ තිබුණි.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට රු.69,995,400 ක බැරකම් පැවතුණ අතර එම බැරකම් නිරවුල් කිරිමට සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන සලසා නොතිබිම නිසා ඒවා නිරවුල් කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ අයවැය යෝජනා අනුව ක්‍රියාත්මක වූ ව්‍යාපෘති සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් එකතුව රු. මිලියන 1,728.46 ක බැරකම්වලට එළඹ තිබුණත්, එම බැරකම් නිරවුල් කිරිමට ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 15501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,083,773 ක් විය. එම හිඟහිටි ශේෂ මාස 06 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අමාත්‍යාංශය අපොහොසත්වී තිබුණි.

## 3.4 විදේශ ආධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍ය ණය යටතේ ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම් අනුව මුළු ශුද්ධ ප්‍රතිපාදනය එකතුව රු. මිලියන 25,753.15 ක් වී තිබුණු අතර එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 23,691.63 ක් උපයෝජනය කර තිබුණි. 2015 ජුනි 30 දින වන විට විගණනය කරන ලද විදේශාධාර ව්‍යාපෘති කිහිපයක් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය

කිලෝ මීටර් 10 ක මළ නාලිකා අළුත්වැඩියාව සහ කිලෝ මීටර් 125 මළ නාලිකාවල තත්ත්වය අධ්‍යයනය කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණි. එම කොන්ත්‍රාත්තු ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය මැටි පයිප්ප (Clay Pipes) සඳහා ප්‍රමාණ පත්‍රයෙහි 6.3.10.11 b (203) ඡේදය අනුව 75N/mm ප්‍රමාණයේ ශක්තියක් පැවතිය යුතු විය. කොළඹ නගර සභාවේ ඉංජිනේරුවන් විසින් පරීක්ෂා කිරීමේදී එම මැටි පයිප්පවල සම්පීඩක ශක්තිය 75N/mm වඩා අඩු පයිප්ප 1020 කට ආසන්න ප්‍රමාණයක් අතුරා තිබූ බව වාර්තා කර තිබුණි.

### (ආ) පළාත් මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2015 දෙසැම්බර් 23 දින වන විට ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණු කෑගල්ල දිස්ත්‍රික්කයේ $SG_2KG_3$ පැකේජ යටතේ අරණායක - අම්බලකන්ද මාර්ගය ඉදිකිරීම් කටයුතු කොන්ත්‍රාත්කරු විසින් නවතා තිබුණි. කාපට් අතුරන ලද මාර්ගයේ බොහෝ ස්ථානවල දෙපස දාරයන් (Edges) කැඩීයාමට පටන් ගෙන තිබුණි. Hard shoulders යෙදීම මෙම කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍ර අයිතමවල (BOQ Item) ඇතුළත් වී තිබුණු අතර ඒවා ව්‍යාපෘති ණය ප්‍රතිපාදන යටතේ නිම කර ගැනීමට නොහැකි වී තිබුණි. මෙම ස්ථානවලට Hard shoulders යෙදීම තුළින් මාර්ගයේ පැවැත්ම වැඩි දියුණු කර ගත හැකිව තිබූ බව විගණනයට නිරීක්ෂණය විය. කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම ප්‍රමාද වීම හා ව්‍යාපෘතියේ මුල් අවධියේ කොන්ත්‍රාත්කරුගේ අකාර්යක්ෂමතාවය හේතුවෙන් මාර්ග ඉදිකිරීම් කටයුතු නියමිත කාල සීමාව තුළ නිම කිරීමට නොහැකි වී තිබුණි. ව්‍යාපෘති කාල සීමාව තුළ ණය ප්‍රතිපාදන ව්‍යාපෘති අරමුණ කරා උපයෝජනය කර ගැනීමට නොහැකි වී තිබුණි.

(ii) මධ්‍යම පළාතේ පළාත් මාර්ග ඉදිකිරීමේ ව්‍යාපෘතියේ අදියර III යටතේ හඳුනාගත් අදියර I හා II යටතේ නිමකර අසාර්ථක වූ මාර්ග කොටස් 4ක් නැවත ඉදිකිරීමට සැලැසුම් කර ඉංජිනේරු ඇස්තමේන්තු පිළියෙළ කිරිම වෙනුවෙන් ජාතික

ගොඩනැගිලි පර්යේෂණායතනය වෙත 2015 අගෝස්තු මාසයේදී රු.මිලියන 1.73 ක් ව්‍යාපෘති අරමුදලින් ගෙවා තිබුණි. මෙම මාර්ග කොටස් ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තු ප්‍රදානය කරන අවස්ථාවේදී කොන්ත්‍රාත්කරුවන් මාර්ග කොටස් 3 ක් සඳහා එකතුව රු. මිලියන 50.28 කට ලංසු ඉදිරිපත් කර තිබුණි. ව්‍යාපෘතිය අවසන් වන අවස්ථාව වන විටත් වටිනාකම රු. මිලියන 8.59 ක් වූ CP3-2 පැකේජය යටතේ වූ මාර්ග කොටස ඉදිකිරීමේ කටයුතු නිම කර නොතිබුණි.

(iii) අනුමත මිලදී ගැනීමේ සැලැස්මෙන් (Approved Shopping List) පරිබාහිර වූ යෝජනා මත මධ්‍යම පළාත් සභාව සඳහා පිරිවැය රු. මිලියන 29.83 ක් වූ Vogels වර්ගයේ Asphalt Premix Paver යන්ත්‍රයක් 2014 ජනවාරි 14 දින මිලදී ගෙන තිබුණි. එම යන්ත්‍රය 2015 දෙසැම්බර් 22 දින වන විට දින 05 ක් පමණක් සේවයේ යොදවා තිබුණු බව අනාවරණය විය. වටිනාකමින් ඉහළ මෙම වත්කම අවුරුදු 02 ක සිට ඌන භාවිතව පවතින බවත්, මේ සඳහා වත්කම වෙනුවෙන් වැය කළ විදේශ ණය හා පොලිය ගෙවීමට සිදුවන බවත්, යන්ත්‍රය ක්‍රියාකාරිත්වයට අවශ්‍ය සම්පත් නොමැතිකම හේතුවෙන් ඉහත වත්කම නිෂ්ක්‍රීය වී තිබුණි.

(iv) අනුමත මිලදී ගැනීමේ සැලැස්ම Approved Shopping List ප්‍රකාරව රු. මිලියන 12.00 ක ප්‍රතිපාදන සලසා තිබූ ධාරිතාව ලීටර් 2000 ක තාර ඉසින බවුසර් යන්ත්‍ර (Bitumen Sprayers ) 04 ක් මිලදී ගැනීමට නොහැකි වී තිබුණි. එය හේතුකොට ගෙන ව්‍යාපෘති අරමුදල් අදාළ අරමුණ සඳහා යොදවා ගැනීමට නොහැකි වී තිබුණි.

**(ඈ) පළාත් මාර්ග ව්‍යාපෘතිය(සම්බන්ධීකරණ ඒකකය)**

**-----------------------------------------------------**

ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වූ පළාත් මාර්ග ව්‍යාපෘතිය අවසන් වීමට ආසන්නයේදී රු. මිලියන 12.94 ක් වැය කරමින් 2015 මාර්තු 28 දින සිට අප්‍රේල් 4 දින දක්වා චීනයේ පැවති පුහුණු පාඨමාලවකට නිලධාරීන් 10 දෙනෙකු සහභාගීවී තිබුණි. එම වියදම 2015 ඔක්තෝබර් 15 දිනෙන් අවසන් කාලච්ඡේදයේ ගිණුම් ප්‍රකාශනවල පුහුණුවීම් යටතේ ගිණුම් ගත කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 ඔක්තෝබර් 11 දිනැති අංක මු.ක්‍ර.අ.01/2010/01 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ චක්‍රලේඛයේ 3 ඡේදයට අනුව පැහැදිලිවම නිලධාරියෙකුගේ සුදුසුකම්, දැනුම හා කුසලතා සංවර්ධනයට අදාළ වැඩසටහන් සඳහා විදේශගතවීමේදී අනියම් දීමනාව ලෙස දිනකට ඩොලර් 30 බැගින් ලබා ගත හැකි වුවද, එම චක්‍රලේඛයට පටහැනිව දිනකට ඩොලර් 50 බැගින් වැඩිපුර ඩොලර් 1600 (රු.224,000) ක් ගෙවා තිබුණි.

(ii) ඉහත පුහුණු පාඨමාලාව සඳහා තායිලන්ත අධ්‍යාපන ආයතනයක් වන Asian Institute of Technology (AIT) තෝරාගෙන ඔවුන්ගේ ශ්‍රී ලංකා නියෝජිතයින් බව දක්වමින් Multiple Challenge Management International (MCMI) නැමැති ආයතනයට ඩොලර් 55,000 ක් ගෙවා තිබුණි. එසේම MCMI ආයතනය මඟින් ලබා දුන් ඉන්වොයිස් පතෙහි සඳහන් ලිපිනයේ එවැනි ආයතනයක් නොමැති බවද, අදාළ කාලසීමාව තුළ තායිලන්තයේ AIT ආයතනය එවැනි පාඨමාලාවක් පවත්වා නැති බවද, ඩොලර් 55,000 ක මුදල AIT ආයතනයට ලැබී නොමැති බවද, මෙම කාලසීමාව තුළ AIT ආයතනයේ පුහුණු පාඨමාලාවක් සඳහා මෙම නිලධාරීන් සහභාගී වී නොමැති බවද, මෙවැනි

පාඨමාලාවක් සම්බන්ධයෙන් AIT ආයතනය හා ලංකාවේ MCMI ආයතනය අතර එකඟතාවයක් නොතිබූ බවද විගණනයේදී අනාවරණය විය.

**(ඇ) උතුරු මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය**

**--------------------------------------------**

මන්නාරම දිස්ත්‍රික්කයේ NP2R හා NP9 කිලෝ මීටර් 38.5 කින් යුතු මාර්ග පැකේජ 2 හි වැඩ නිම කිරීමට අපේක්ෂිත දිනය වූ 2016 ජනවාරි 10 දින වන විට මාර්ගයේ අඩකට ආසන්න ප්‍රමාණයකින්වත් නිමකර නොතිබුණි. එහි භෞතික ප්‍රගතිය සියයට 31 ක් හා සියයට 25 ක් වැනි ඉතා දුර්වල මට්ටමක පැවැතුණි.

**(ඉ) උතුරු මාර්ග සම්බන්ධ කිරීමේ ව්‍යාපෘතිය (අතිරේක ප්‍රතිපාදන)**

**------------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i)2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව උතුරුමැද පළාත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකකය මගින් අනුමත කාර්ය මණ්ඩලයේ නොතිබුණු තනතුරු 3 ක් සඳහා ඔවුන්ගේ වැටුපෙන් 1/6 ක මෙහෙයුම් හා අධීක්ෂණ කාර්ය මණ්ඩල දීමනා වශයෙන් රු.305,908 ක් 2015 වර්ෂයේදී උතුරු මැද පළාත් සභාවේ නිලධාරින් තිදෙනෙකු වෙනුවෙන් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය මත ව්‍යාපෘති අරමුදලින් ගෙවා තිබුණි.

(ii) කිලිනොච්චි දිස්ත්‍රික්කයේ එක් මාර්ග පැකේජයක භෞතික ප්‍රගතිය සියයට 21 ක් වැනි දුර්වල මට්ටමක පැවැතුණු අතර මුලතිව් දිස්ත්‍රික්කයේ එක් මාර්ගයක කොන්ත්‍රාත්තුව ව්‍යාපෘතිය ආරම්භ කර වසර 2 ½ කට පසුව පිරිනමා තිබුණි. එහි භෞතික ප්‍රගතිය සියයට 1 ක් වැනි ඉතා දුර්වල මට්ටමක පවතින බවත්, 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා අධ්‍යයනයේදී නිරීක්ෂණය විය.

**(ඊ) පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (ටීඑස්ඊපී)**

**--------------------------------------------------------------------------------**

ව්‍යාපෘතියේ මෙහෙයුම් හා කළමනාකරණ සහාය ඒකකයේ නිලධාරීන් 07 දෙනෙකු සඳහා ව්‍යාපෘති නිලධාරින් හට හිමි නැති සන්නිවේදන දීමනා වශයෙන් රු.247,500 ක් 2015 වර්ෂයේදී ගෙවා තිබුණි. ඊට අමතරව එම නිලධාරීන් සඳහා අන්තර්ජාල පහසුකම් සහිත ඩොන්ගල් සම්බන්ධතා ලබා දී තිබූ අතර මාස 11 ක කාලයකට අදාළව රු.171,816 ක බිල්පත් ව්‍යාපෘතිය විසින් ගෙවා තිබුණි.

**3.5 කාර්යසාධනය**

**----------------**

2015 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳව පහත කරුණු නිරීක්ෂණය විය.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**---------------------------------------------------**

අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන් ඉටු නොකර හා ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i)** **ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක මධ්‍යස්ථානය**

**----------------------------------------------------------------**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2015 දෙසැම්බර් 31 දින වන විට ව්‍යාපෘති 04 ක භෞතික ප්‍රගතිය සියයට 0 ක් හා ව්‍යාපෘති 03 ක ප්‍රගතිය සියයට 20 ක සිට සියයට 30 ක් දක්වා පරාසයක ප්‍රමාණයක ඉතා දුර්වල මට්ටමක පැවැතුණි.

- 2015 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්ම මඟින් ව්‍යාපෘතීන් 05 ක් සඳහා අපේක්ෂිත වියදම රු. මිලියන 29.20 ක් ඉක්මවා රු. මිලියන 15.24 ක් වැය කර තිබුණු බව ප්‍රගති වාර්තාව පරීක්ෂාවේදී අනාවරණය විය.

**(ii)** **පළාත් පාලන අංශය**

**----------------------**

මෙම අංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

- 2015 සැප්තැම්බර් 07 දින සිට 13 දින දක්වා නම් කර තිබූ පළාත් පාලන සතිය සඳහා එක් එක් දිනයන් වෙනුවෙන් විවිධ මාතෘකා යටතේ වැඩ සටහනක් සකස් කර පළාත් පාලන කොමසාරිස්වරුන් මඟින් පළාත් පාලන ආයතනවලට යවා තිබූ නමුත් එම ව්‍යාපෘතිය ක්‍රියාකාරි මට්ටමක නොතිබුණි.
- පළාත් පාලන ආයතන අතර තරඟ පැවැත්වීම වෙනුවෙන් 2015 වර්ෂයේ සලසා තිබූ රු.මිලියන 15 ක ප්‍රතිපාදනවලින් රු.මිලියන 5.44 ක් පමණක් උපයෝජනය කර තිබුණි. පළාත් 05 ක පමණක් මෙම තරඟය පවත්වා එම පළාත් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට ප්‍රතිපාදන ලබා දී තිබුණි.

**(iii)** **සංවර්ධන අංශය**

**-------------------**

මෙම අංශයේ කාර්යසාධනය පරීක්ෂා කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

- හක්මන නගර සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති කාර්යයන් 30 ක් සැලැසුම් කර තිබුණි. 2015 වර්ෂය අවසන් වන විට රු.මිලියන 18.72 ක් වැය කර ව්‍යාපෘති 18 ක් නිමකර තිබුණු අතර රු.මිලියන 14.54 ක ව්‍යාපෘති 7 ක් අනුමත කර නොතිබුණි. ව්‍යාපෘති 5 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

- දෙහිඕවිට නගර සංවර්ධනය වෙනුවෙන් නව ව්‍යාපෘති 7 කින් වටිනාකම රු.මිලියන 34.56 ක් වූ ව්‍යාපෘති 3 ක් අනුමත කර නොතිබුණු අතර ව්‍යාපෘති 2 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

- 2015 වර්ෂයේ පල්ලෙපොළ නගර සංවර්ධනය සඳහා නව ව්‍යාපෘති 4 ක් සැලැසුම් කර තිබූ අතර ඉන් රු.මිලියන 35.5 ක් වූ ව්‍යාපෘති 3 ක් නිමකර නොතිබුණි.

- බෙලිඅත්ත නගර සංවර්ධනයේ නාගරික පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 84.82 ක් සමාලෝචිත වර්ෂයේදී අනුමත කර තිබූ අතර එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි.

- අක්කරෙයිපත්තු නගර සංවර්ධනය සඳහා ව්‍යාපෘති 15ක් අනුමත කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 03 ක ප්‍රගතිය සියයට 20 ක් වැනි දුර්වල මට්ටමක පැවති අතර එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි.

- උතුරු නැගෙනහිර පළාත් පාලන ආයතනවල නව ගොඩනැගිලි ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 54.52ක් ප්‍රතිපාදනය කර තිබුණද, ඉන් ව්‍යාපෘති 05 ක් ආරම්භ කර නොතිබුණි.

- ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති කාර්යයන් 10 ක් අනුමත කර තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් 2015 දෙසැම්බර් 31 දින වන විට නිම කර නොතිබුණු අතර එහි ප්‍රගතිය සියයට 20 ක සිට සියයට 60 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් දුර්වල මට්ටමක පැවතුණි.

- හදිසි ආපදා ප්‍රතිචාර ජාලය වැඩිදියුණු කිරීමේ වැඩසටහන යටතේ 2014 වර්ෂයේ අවිච්ඡේද කාර්යයන් 08 ක් අනුමත කර තිබූ අතර ඉන් ව්‍යාපෘති 06 ක් 2015 දෙසැම්බර් 31 දින වන විටද නිම කර නොතිබුණි. 2015 වර්ෂය සඳහා අවිච්ඡේද ව්‍යාපෘති 4 ක්ද ඇතුළත්ව රු.මිලියන 120ක ප්‍රතිපාදන සලසා තිබූ නමුත් එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

- ප්‍රාදේශිය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන සඳහා රු.මිලියන 1,400 ක ප්‍රතිපාදන සළසා තිබූ අතර ඉන් රු.මිලියන 855 ක් උපයෝජනය කර තිබුණි. තවද මෙම වැඩසටහනේ 2015 දෙසැම්බර් 31 දිනට සියයට 58 ක මූල්‍ය ප්‍රගතියක් පෙන්වා තිබුණද එහි භෞතික ප්‍රගතිය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 කළමනාකරණ දුර්වලතා**

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) ධූමායන යන්ත්‍ර මිලදී ගැනීම හා බෙදා හැරීම.**

---------------------------------------------------

ජාතික ඩෙංගු මර්ධන ඒකකය මඟින් නම් කර එවා තිබූ අවදානම් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කොට්ඨාශ සඳහා 2015 ජූනි මාසයේ ධූමායන යන්ත්‍ර 24 ක්ද, 2015 ඔක්තෝබර් මාසයේදී නැවත ධූමායන යන්ත්‍ර 11ක්ද වශයෙන් මිලදී ගෙන බෙදා හැර තිබුණි. 2016 මැයි මාසය වන විටත් පළමුව ලබා දුන් යන්ත්‍ර 24 න් 3 කටද, දෙවනුව දුන් යන්ත්‍ර 11 කින් 7 කටද, භාණ්ඩ ලැබීමේ තුන්ඩු අමාත්‍යාංශයට ලැබී නොතිබුණි.

**(ආ) කොම්පෝස්ට් හලන යන්ත්‍ර මිලදී ගැනීම හා බෙදා හැරීම.**

-----------------------------------------------------------------

කොම්පෝස්ට්කරණ ව්‍යාපෘතිය ආරම්භ කර ඇති පළාත් පාලන ආයතන සඳහා කොම්පෝස්ට් හලන යන්ත්‍ර 20 ක් වසරක වගකීම් කාලයකට යටත්ව රු. 6,682,640 කට 2015 ඔක්තෝබර්

මාසයේදී මිලදී ගෙන බෙදා හැර තිබුණි. පළාත් පාලන ආයතන 8 ක් විසින් 2016 මැයි මාසය අවසන් වන විටද එම යන්ත්‍ර ස්ථාපිත කොට ව්‍යාපෘති කටයුතු ආරම්භ කර නොතිබුණි.යන්ත්‍ර 4 ක් වෙනත් පළාත් පාලන ආයතන 4 කට මාරු කර යවා ක්‍රියාත්මක තත්ත්වයේ ඇති අතර ඉතිරි යන්ත්‍ර 4 ක් 2016 ජූලි 28 දින වන විටද එම ස්ථානවල අක්‍රියව පැවතුණි. අවශ්‍යතාව හදුනාගැනීමකින් තොරව යන්ත්‍ර මිලදී ගෙන බෙදා හැර තිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 25 | 10 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (iii) | ද්විතියික මට්ටම | 152 | 148 | 04 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 55 | 75 | - | 20 |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **245** | **250** | **16** | **21** |